රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
Department of State Accounts

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | SA/MAA/02/03/01 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024.05.22 |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**<u>සංවර්ධන ව්‍යාපෘති යටතේ 2024 වර්ෂය සඳහා අයවැය මගින් වෙන් වී ඇති ප්‍රතිපාදන මත වියදම් ගිණුම්ගත කිරීම</u>**

2023 වර්ෂය දක්වා අයවැය ඇස්තමේන්තු සැකසීමේ දී සංවර්ධන ව්‍යාපෘති සඳහා වැය විෂයය අංක 2505, 2506 හා 2509 යන මූලධන වැය විෂයයන් යටතේ ප්‍රතිපාදන වෙන් කිරීම සිදුවිය.

කෙසේ වුව ද, එම වැය විෂයයන් යටතේ ප්‍රතිපාදන ලබාදීමේ දී අදාළ ව්‍යාපෘති මගින් ජනනය වන වත්කම් ගිණුම්කරණ පද්ධතිය තුළ ගිණුම්ගත වීමක් සිදු නොවීම ගැටළුකාරී තත්ත්වයක් ලෙස හඳුනාගන්නා ලදී.

ඉහත ගැටළුවට පිළියමක් ලෙස ව්‍යාපෘති වියදම් යටතේ ජනනය වන වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට හැකි වන පරිදි 2024 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන් කිරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර ඇත.

ඒ අනුව, මෙතෙක් සංවර්ධන ව්‍යාපෘති සඳහා වැය විෂයය අංක 2505, 2506 හා 2509 යන වෙනත් මූල්‍ය වියදම් වැය විෂයයන් යටතේ වෙන් කළ ප්‍රතිපාදන 2024 අයවැය ඇස්තමේන්තුව මගින් මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වැය විෂයයන් යටතේ වෙන් කිරීමට කටයුතු කර තිබේ.

කෙසේ වුව ද, ඇතැම් වාර්තාකරණ ආයතනවලට එසේ වෙන් කර ඇති ප්‍රතිපාදන මත වියදම් ගිණුම්ගත කිරීමේ දී ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණ පෑමට සිදු වී ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව, 2024 අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන් කළ මූලධන වියදම්වලට අදාළව ලබා දී ඇති වැය විෂයයන් නිවැරදි කළ යුතු නම් අවශ්‍යතාව පරිදි ප්‍රතිපාදන ගලපා ගැනීම් සිදු කිරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව එකඟ වී ඇත.

එබැවින්, එසේ ප්‍රතිපාදන ගලපා ගැනීම් සිදුකිරීමට අවශ්‍ය අවස්ථාවල ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අවශ්‍ය විධිවිධාන සලසා ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

ඩබ්.ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත:

01. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කරු. අ.ක.ස.

මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව  பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை.  General Treasury, Colombo 01, Sri Lanka.
General-Tel.: +94 11 2484500/600  Ext.: 1149
Director General - Tel.: +94 11 2484728
Fax: +94 11 2484869
Fax: +94 11 2473856
Website: www.sad.gov.lk
e - mail : dgsa@sad.treasury.gov.lk